# බෞද්ධ හා ප්‍රොයිඩියානු මනෝවිශ්ලේෂණයට තුලනාත්මක ප්‍රවේශයක්

**කුඹුගොඩ ආරේ පඤ්ඤාලෝක හිමි**

මනස පිළිබඳ සංකල්පය දූරාතීතයේ සිට ම මිනිසා වඩාත් වෙහෙසට පත්කළ ගැටලුවලින් එකකි. පෙරදිග මෙන් අපරදිග දර්ශනවාද තුළ ද මේ පිළිබඳව බහුලව සාකච්ඡා වී තිබේ. ක්‍රි.පූ. 2800ක තරම් පෞඪ ඉතිහාසයකට දිවෙන ඉන්දීය දර්ශනවාද තුළ ද මනස පිළිබඳ ගැටලුව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරයි. බටහිර දර්ශනය ද ක්‍රි.පූ. 06 වන ශතවර්ෂයට වඩා පැරණි නැත. විශ්ව සම්භවය පිළිබඳ කරුණු සෙවීම මූලික කරගත් බටහිර දර්ශනයේත් පෙරදිග දර්ශනයේත් අරමුණු විටෙක සාම්‍යත්වයක් මෙන්ම අසාම්‍යත්වයක් ද පෙන්වයි. කෙසේ වෙතත් මනස පිළිබඳ ලොව ගැඹුරු ම විශ්ලේෂණය ක්‍රි.පූ. 06 වන ශත වර්ෂයේදී ලොව පහළ වූ බුදුරදුන් විසින් ඉදිරිපත් කළහ. බටහිර දර්ශනවාද අතරින් මනස පිළිබඳ ගැඹුරු ම අධ්‍යයනය සිදුකරන්නේ නූතන මනෝවිද්‍යාවයි. ක්‍රි.ව. 1800 දී පමණ මනෝවිද්‍යාව නිත්‍ය වශයෙන් ලොවට හඳුන්වා දුන් අතර මනස පිළිබඳ අධ්‍යයනය මුල් යුගයේදී දර්ශනයට අයත්ව තිබුණි. 16 - 17 සියවස්වල දාර්ශනික අදහස් ද මෙයට බලපා ඇත. නිදසුනක් ලෙස දේකාර්ත් ප්‍රකාශ කලේ "මම සිතමි. එබැවින් මම පවතිමි[1]. (I am thinking- of am being) යන්නයි. මනස පුම්බා තැබීම බටහිර මනෝ විද්‍යාව තුළ සුවිශේෂී ලක්ෂණයකි. එබැවින් එයට පැලැස්තර දමමින් එය ආරක්ෂා කර ගැනීමේ මහා මෙහෙයුමක ඔවුහු නිරත වෙති. ඒ අනුව බටහිර මනෝ විශ්ලේෂණය තුළ "පැවැත්ම සඳහා සිතීම (being) හා 'සිතිම සඳහා සිතීම[2]" ප්‍රබල



සංකල්පයකි. නමුත් බෞද්ධ ඉගැන්වීමට අනුව මනසින් නිදහස් වීම වැදගත් වූවකි. මනස නැමැති මිථ්‍යාව තුළ රැඳී සිටිමින් සසර ගමන දීර්ඝ කරගත යුතු නොවේ. මෙහිදී සිතීම වෙනුවට ඉදිරිපත් කරන්නේ දැකීමයි (secting). නිවැරදිව මනස අධ්‍යයනය කොට ඒ තුළින් සංඛාර හෙවත් රැස් කිරිම් ඉවත් කළ යුතු වේ.

කෙසේ වෙතත් මෙහිදී අපගේ මූලික අභිප්‍රාය වන්නේ මනෝ විද්‍යාවේ මනස පිළිබඳ සියලු ඉගැන්වීම් විශ්ලේෂණය කිරිම නොවේ. සිග්මන් ප්‍රොයිඩ් ඉදිරිපත් කළ මනෝ විශ්ලේෂණවාදී න්‍යාය හා බුදුරදුන්ගේ මනෝ මූලික සිද්ධාන්ත පිළිබඳ තුලනාත්මක අධ්‍යනයක් සිදු කිරිමයි. එහිදී පශ්චාත් බෞද්ධ මනෝ විශ්ලේෂණ ඉගැන්වීම් සේම පශ්චාත් ප්‍රොයිඩියානු මනෝ විශ්ලේෂණයන් ද අධ්‍යනයට හසු වේ. උක්ත උභය අංශය තුළම පොදුවේ දැකිය හැකි ක්‍රමවේද රාශියක් මනෝ විශ්ලේෂණාත්මක ඇගයුම් මත පදනම්ව ඇත. ඒ අතර,

- මනසේ ව්‍යුහය
- පෞරුෂ සංකල්පය
- මනෝ රෝග
- මනෝ ප්‍රතිකාර ප්‍රධාන වේ.

මනස පිළිබඳ අධ්‍යයනයන් ද අඩු වශයෙන් සිදුකරමින් වෙනත් සංකල්ප ඔස්සේ ගමන් කළ මනෝවිද්‍යාව නව මගකට ගැනීමට සිග්මන් ප්‍රොයිඩ් (Sigmund freud) සමත් විය. බෞද්ධ හා ප්‍රොයිඩියානු ඉගැන්වීම් පොදුවේ පිළිගත් එක් ප්‍රධාන කරුණක් වේ. එනම් පුද්ගල චර්යාව සඳහා මනස බලපාන්නේය යන්නයි. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි. චෙතයිත්වා කම්මං කරොති කායෙන වචාය මනසා"[3] (චේතනාව මූලික වී කයින් වචනයෙන් මනසින් කර්ම සිදුකිරීම කර්මයයි). චේතනාව මූලික නොවී ඇතිවන පුද්ගල චර්යාව ශූන්‍ය තත්ත්වයෙන් බුදුසමය පෙන්වා දේ. බුදුරදුන් අවධාරණ කළ මෙම මනෝමූලික සිද්ධාන්ත පශ්චාත් බෞද්ධ සම්ප්‍රදායන් ද එකහෙළා පිළිගත් අතර යෝගාචාර විඥානවාදීන් ඉදිරිපත් කළ විඥානවාදී සංකල්ප

පමණක් තරමක වෙනස් විවරණයක් ගන්නා බව පෙනේ. ප්‍රොයිඩ්ගේ සේම පශ්චාත් ප්‍රොයිඩියානු ඉගැන්වීම් ද මනෝ මූලික සිද්ධාන්ත මත පිහිටා ඇති අතර පුද්ගල චර්යාව හා මනස අතර දැඩි සබඳතාවයක් ඇති බව ද එක හෙළා පිළිගැනේ. ප්‍රොයිඩ් මිනිස් සිතේ මූලික මට්ටම් තුනක් පිළිබඳව කරුණු ඉදිරිපත් කරයි. මනස පිළිබඳ ඉදිරිපත් වූ විග්‍රහයන් ප්‍රධාන අංශ දෙකකට බෙදේ. එනම්,

- පෙර විග්‍රහය
- පසු විග්‍රහය වශයෙනි.

පෙර විග්‍රහයට අනුව මනසේ ප්‍රධාන කොටස් 03 කි.

- සවිඥානය - Conscious
- උප විඥානය - Sub conscious
- අවිඥානය - Unconscious වශයෙනි.

පුද්ගල සංවර්ධන අවධි පිළිබඳ අවධානය යොමු කළ ප්‍රොයිඩ් පෙර විග්‍රහය වෙනස් නොකරම පසු විග්‍රහයක් ද ඉදිරිපත් කලේය.

- Id සංස්කාරය
- Ego සංස්කාරය
- Super ego සංස්කාරය යනු එම පසු විග්‍රහයයි.

විඥානය යනු පුද්ගලයාගේ දෛනික ජීවිතයට අදාළ සිතයි. පුද්ගලයාගේ ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වයට අදාළ වන්නේ මෙම විඥානයයි. එනම් අප සාමාන්‍ය වශයෙන් දන්නා සිතයි.

උප විඥානය නම් විඥානයට හා අවිඥානයට අතරමැදි තත්ත්වයකි. සිතෙහි ඇති අදහස් ඉෂ්ට කර ගැනීමට අපහසු වූ විට ඉච්ඡාභංගත්වයට පැමිණ එම අදහස් යටි සිතෙහි තැන්පත්වීමට උත්සාහ දරයි. එසේ යටි සිතෙහි තැන්පත් කරන විට ඉන් සමහරක් උපවිඥානයෙහි තැන්පත් වේ. ඒවා පහසුවෙන් මතකයට නඟාගත හැකිය.



අවිඥානය සිතේ වඩාත් ම වැදගත් කොටසයි. මෙය උත්සාහ කළත් දැනගත නොහැකි කොටසකි. අවිඥානය පිළිබඳ අපට දැනගත හැක්කේ සම්මෝහනයෙනි. මෙහි සැඟව ඇති අදහස් ලෙඩරෝග ඇතිවීමට බලපායි.

පසු විග්‍රහයට අනුව "ඉඩ්" යනු සිතේ රළු අදහස් ය. ඉඩ් බාහිර ලෝකය හා සදාචාරය පිළිබඳ කල්පනා නොකරයි. ඉඩ්ගේ ප්‍රධාන ලක්ෂණය සුඛ වේදනයන් (Pleasure Principle) තෘප්තිමත් වීමයි.

ඊගෝ යනු සමාජය විසින් මිනිසාගේ මනසට ඇතුළත් කර ඇති තහංචි පිළිබඳ ආකල්පයන් ය. බොහෝ අවස්ථාවල ඊගෝ මගින් ඉඩ් පාලනය වේ. මෙයට තර්කනය, චින්තනය, නීතිය, සදාචාරය පිළිබඳ හැඟීමක් ඇත. එනිසා ඉඩ්ට අනුව කටයුතු කිරීමට ඊගෝ ඉඩ නොදේ. ඊගෝට වඩා ප්‍රගුණ වූ හෘද සාක්ෂිය සුපර් ඊගෝ නම්. යහපැවැත්ම, සමාජයට අනුගතවීම වැනි ගුණයන්ගෙන් මෙය පිරී ඇත. සුපර් ඊගෝ තුළින් ඉඩ් දක්ෂ ලෙස පාලනය කළ හැකිවේ.

බුදු දහම මනස පිළිබඳ ප්‍රබල විශ්ලේෂණයක් සිදු කරන අතර එය සැමවිටම ප්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණයට වඩා ගැඹුරු මෙන්ම සංකීර්ණ ස්වභාවයක් ද ගනී, "මනෝ පුබ්බංගමා ධම්මා"[4] යනාදි වශයෙන් උගන්වන බුදුදහම සියල්ල සඳහා මනස නමැති ඉන්ද්‍රිය බලපානු ලබන බව පවසයි. බෞද්ධ මනෝ විශ්ලේෂණය ද ප්‍රධාන තේමා 3ක් ඔස්සේ විවරණය වේ. එනම්,

- චිත්ත
- මනෝ
- විඤ්ඤාණ යනුවෙනි.

මෙහිදී මන යන්න ඉන්ද්‍රිය අර්ථයෙන් විග්‍රහ කොට ඇති අතර චිත්ත, විඤ්ඤාණ සංකල්ප තුළ උපයුක්තව ඇත්තේ ආනුභූතික හා ක්‍රියා අර්ථයන් ය. ප්‍රොයිඩ් ඉදිරිපත් කළ මනෝ විශ්ලේෂණය බුදු දහමට සමීපත්වයක් දක්වූවද සමානකමක් හෝ එම අදහස් ඉක්මවා යාමක් කිසිසේත් ම සිදු නොවේ.[5] බෞද්ධ චිත්ත විග්‍රහය

සෑමවිටම පුද්ගල සදාචාර සංකල්ප ඉලක්ක කර ගනිමින් විවරණය වුවකි. එසේම මනස යන්න ඉන්ද්‍රිය ගෝචර වන්නක් ද නොවේ. මේ අදහස ප්‍රොයිඩ්ගේ විශ්ලේෂණය තුළ ද දකිය හැක. ඔහුගේ විවරණයට අනුව මනස ඉන්ද්‍රිය ගෝචරයන්ට ලක් කළ නොහැක්කකි. නමුත් පුද්ගලයාට එය සෑමවිටම බලපායි. බෞද්ධ මනෝ විග්‍රහය තුළ මනස පිළිබඳ ගැඹුරු විග්‍රහයක් ඇතුළත් වේ. විශේෂයෙන් අභිධර්ම පිටකය තුළ මනෝ විග්‍රහය භෞතික හා අධිභෞතික සංකල්පයක් වශයෙන් විග්‍රහ කර තිබේ. ප්‍රොයිඩ්ගේ විශ්ලේෂණය තුළ අධිමානසික විවරණයක් දක්නට නොලැබේ. නමුත් අභිධර්ම පිටකාගත ලෝකෝත්තර සිත් ප්‍රධාන වශයෙන් ම අධිමානසික තත්ත්වයන්ගේ විවරණයකි. බෞද්ධ අධිමානසික විද්‍යාව තුළ ළඟාවිය හැකි තත්ත්ව රාශියකි ඒ අතර,

- සෝවාන්
- සකෘදාගාමී
- අනාගමී
- අර්හත්
- පසේ බුද්ධත්වය මුලික වේ.
- බුද්ධත්වය

මෙම තත්ත්වයන්ට පත්වන විට මනසේ විවිධ සංවර්ධන අවධි පසු වේ. එසේම බෞද්ධ මනෝ විශ්ලේෂණයට අනුව සිත දියුණු කිරීමේ අග්‍රඵලය බුද්ධත්වයයි. එහිදී ඇතිවන අධිමානසික ඥාන අතර,

- ඉද්ධිවිධ ඥානය - සෘද්ධි ප්‍රාතිහාර්යය
- දිබ්බසෝත ඥානය - දිව්‍යමය කන
- දිබ්බචක්ඛු ඥානය - දිව්‍යමය ඇස
- ආසවක්ඛය ඥානය - කෙලෙස් විනාශ කිරීම
- චුතූපපාත ඥානය - චුති උත්පත්ති පිළිබඳ නුවණ
- පරචිත්ත විජානන ඥානය - පර සිත් දකින නුවණ ප්‍රධාන වේ.



ප්‍රොයිඩ්ගේ ඉගැන්වීම තුළ සඳහන් වන්නේ මනස තුළ ආශ (libido) ඇති බවත් ඒවා පාලනය කළ යුතු බවත් ය. බුදුසමය ආශ හෙවත් කෙලෙස් 1500 පමණ විවරණය කරයි.[6]

ප්‍රොයිඩියානු විග්‍රහයට අනුව ප්‍රධාන ආශ වර්ග 02කි.

- ජීවිත ආශය - life instinct
- මරණ ආශය - Death instinct

ප්‍රොයිඩියානු විවරණය තුළ පැන නැගෙන ආශ 02කට සමාන ආශ වර්ග 03 බුදු සමය අවධාරණය කරයි. මෙම විවරණය ද ඉතා පුළුල් පරාසයකට විහිදී යයි. ප්‍රොයිඩ්ගේ ආශ විවරණය මෙලොව වශයෙන් හොඳ පෞරුෂයක් පවත්වා ගැනීම සඳහා වන අතර බෞද්ධ විවරණයේ ආවසානික අරමුණ නිර්වාණයයි. බෞද්ධ ආශ වර්ග 03කි.

| | |
|---|---|
| කාම තණ්හා<br>භව තණ්හා | } ජීවිත ආශය |
| විභව තණ්හා | - මරණ ආශය |

ජීවිතය පවත්වා ගැනීමටත් අවශ්‍යතා සපුරා ගැනීමටත් පුද්ගලයා තුළ ඇතිවන මූලික ප්‍රේරණ දෙක කාමතණ්හාව සහ භවතණ්හාවයි. එනම් ජීවිත ආශයයි, ඉච්ඡාභංගත්වයන් හමුවේ ජීවිතයෙන් පලායෑමේ අවශ්‍යතාව විභව තණ්හා හෙවත් මරණ ආශයි. බෞද්ධ හා ප්‍රොයිඩියානු මනෝ විශ්ලේෂණයේ ප්‍රබල සාම්‍යත්වයක් දක්වන කරුණු අතර මෙය ප්‍රමුඛ වන බැවින් එය විස්තරාත්මකව සසඳා බැලිය යුත්තකි.

## කාම තණ්හා

ඉඳුරන් පිනවීම "කාම" යන්නෙන් ජනිත වන සාමාන්‍ය අර්ථයයි. ප්‍රොයිඩ් මෙන්ම බුදුරදුන් ද මෙමගින් ලිංගිකත්වය ද අපේක්ෂා කොට තිබේ. දෙපාර්ශවය ම කාම යන්නෙන් 'සැපයට ඇති කැමැත්ත' අපේක්ෂා කර ඇත. පංච ඉන්ද්‍රියන් පිනවීම

බෞද්ධාර්ථය වන අතර ෆ්‍රොයිඩ් මෙමගින් අර්ථ 02ක් අපේක්ෂා කර ඇත.

- ශාරීරක සොම්නස
- ආදරය පිළිබඳ හැඟීම

මේ අතරින් සොම්නස් මූලධර්මය ( Pleasure principle ) ප්‍රමුඛ වේ. මිනිසුන් දුක ප්‍රතික්ෂේප කරන අතර සැප කැමති වේ. (සුඛකාමා දුක්ඛ පටික්කූලා) සියලු පුද්ගල පෙළඹීම් සඳහා සැපයට ඇති කැමැත්ත මූලික වන බව දෙපාර්ශ්වයේ ම පිළිගැනීමයි. ෆ්‍රොයිඩ් සිය "Beyond the pleasure principle" කෘතියේදී මේ පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් සිදු කරයි. බෞද්ධ විවරණයට අනුව කාම වර්ග 02 කි.

- වස්තු කාම
- ක්ලේශ කාම

පංච ඉන්ද්‍රියන් පිනවීමට ඇති කැමැත්ත වස්තු කාම යන්නෙනුත්, ඉඳුරන් පිනවීමට පොළඹවන මානසික තත්ත්වය ක්ලේශ කාම යන්නෙනුත් පැහැදිලි වේ. කාමරාග යනුවෙන් ද මෙය හැඳින්වේ.

පුද්ගල චර්යාව සඳහා බලපාන " අනුසය" හෙවත් "කෙලෙස්" මනසේ සැඟවී සිටින, නිද්‍රෝපගත අකුසල ප්‍රේරණයන්ය.[7] ෆ්‍රොයිඩියානු විවරණයට අනුව අවිඥානගතව පවතින ඉඩ් සංකල්පය ද අනුසය ධර්මයන්ට සමාන වේ. ඉඩ් තුළ පවතින අනුසයන් උපතින් ම පුද්ගල මනස තුළ උරුම වන අතර බුදුරදුන් මහා මාලුඞ්ක්‍ය සූත්‍රයේදී විවරණය කරන ආකාරයට කුඩා දරුවන්ගේ මනස තුළ ද අනුසය පවතින අතර පසුව එය කෙලෙස් බවට පරිවර්තනය වේ. ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ පෞරුෂ සංවර්ධන අවධි 05කි.

- මුඛීය අවධිය - Oral Phase
- පායුක අවධිය - Anal Phase
- ලිංගරූප අවධිය - Phallic Phase



- ගුප්ත අවධිය - Latency Phase
- ලිංගික අවධිය - Genital Stage

මෙම පෞරුෂ සංවර්ධන අවධි තුළ ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන්නේ කාමාශාව සහ ස්වීයත්ව සංකල්පයයි. බෞද්ධ පෞරුෂ විග්‍රහය තුළ කාමරාගය හා මමායනය හෙවත් තෘෂ්ණාව සම්පූර්ණයෙන් නැති කළ යුතු වේ. තෘෂ්ණාව නැති කිරීමෙන් විමුක්තිය වේ.[8] (තණ්හක්ඛයො නිරොධො නිබ්බානං) නමුත් ෆ්‍රොයිඩ් පවසන්නේ ස්වීයත්වය වර්ධනය කළ යුතු අතර කාමරාගය හෙවත් කාමාශාවන් සම්පූර්ණයෙන් පාලනය නොකළ යුතු බවයි. මෙය විද්‍යාවේත් ආගමේත් වෙනස පැහැදිලි වන කදිම නිදසුනකි.

## භව තණ්හා

පුද්ගල ආත්මයක් ඇතැයි යන ශාස්වත දෘෂ්ටිය හේතුවෙන් භව තණ්හාව ඇති වේ. නොකඩවා තම ජීවිතය පවත්වා ගැනීමේ ආශාව (භවරාග අනුසයං) මෙමගින් අපේක්ෂා කෙරේ. ජීවිතයට හානියක් වන අවස්ථාවන්හි පැහැදිලිව ම භව තණ්හා ඇති වේ. බෞද්ධ ආර්ය මාර්ගයේ පළමු පියවර වන සෝවාන් තත්වයට පත් වූ විට භව තණ්හාව නැති වේ. සක්කාය දිට්ඨි හෙවත් ආත්මය පිළිබඳ හැඟීම් සමගින් නැති වී නිවැරදි දෘෂ්ටියක් ඇති වේ. අහංකාරය හෙවත් මාන තුනක් මෙගින් අපේක්ෂා කෙරේ.

- හීන මාන - පහත් යැයි සිතීම
- සෙය්‍යමාන - උසස් යැයි සිතීම
- සදිසමාන - සමාන යැයි සිතීම

මෙම විග්‍රහය ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ 'ද්විතියික නාසිවාදය' (Secondary Narcissim) යන්නට සමාන වේ. මනෝමය ජීවයකින් හෙබි ආත්මය ඉඩ් තුළ තැන්පත්ව ඇත. ෆ්‍රොයිඩ්ගේ භාවාශය පිළිබඳ සංකල්පය මෙහිදී මතු වේ. ආත්ම මායාව පිළිබඳ අදහස මෙහිදී මූලික වන අතර බුදුසමය ද මෙයට සමාන චෛතසික 02ක් ඉදිරිපත් කරයි. එනම්,